පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.28 පැය 1120 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/160 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ජීව අත්බෝම්බ දෙකක් නිශ්ක්‍රීය කිරීම - බෙලිඅත්ත පොලිස් වසම.**

2025.01.27 වන දින සවස් කාලයේ බෙලිඅත්ත පොලිස් වසමේ පට්ටියවෙල, නිහළුව ප්‍රදේශයේ විහාරස්ථාන භූමියක දිරාගිය අත්බෝම්බ දෙකක් හමු වී ඇති බවට බෙලිඅත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමශර්න කටයුතු ආරම්භ කර ඇත.

මෙම විහාරස්ථාන භූමියේ ළිඳ පිහිටි ප්‍රදේශය ට්‍රැක්ටර් රථයක් යොදා ගෙන ශුද්ධ පවිත්‍ර කරමින් සිටියදී යම් පිපිරීම් හඬක් ඇසීම හේතුවෙන් ඒ අවට සොයා බැලීමේදී පුපුරා නොගිය දිරාපත් වූ අත්බෝම්බ 02 ක් හමු වී ඇති බවට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මේ සම්බන්ධයෙන් බෙලිඅත්ත පොලිසිය මඟින් තංගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාතර්ා කර විශේෂ කායර් බලකා නිලධාරීන් කැඳවා මෙම ජීව අත්බෝම්බ දෙක නිශ්ක්‍රීය කිරීමට කටයුතු කරන ලදි.

බෙලිඅත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**